සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02යි.**

### I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **පහත දක්වා ඇති ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යොදන්න.**

1. අප නොදන්නා සමාජීය තොරතුරු රැසක් ජනකතා ඇසුරෙන් ලබා ගත හැකිය. ( )
2. ස්වභාවික පරිසරයේ දැකිය හැකි හිරු නැගීම නිර්මාණශීලීව අනුකරණය කළ හැකිය. ( )
3. දෙවියන්, සුරංගනාවන් මානුෂික චරිත වේ. ( )
4. නිර්මාණකරණය සඳහා පරිකල්පනය වැදගත් වේ. ( )
5. ගස් කපන්නකුගේ චරිතය නිරූපණයේදී භාවිත කරන පොරොව නාට්‍යෝපකරණයකි. ( )

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

6. කතන්දරයකට වඩා නාට්‍යයක් තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
   1. චරිත තිබීම 2. සිද්ධි තිබීම 3. රංග විධාන තිබීම 4. සංවාද තිබීම

7. ක්ෂණික නිරූපණයකදී දුරකථනයක් ලෙස භාවිත කළ හැකි ආදේශක භාණ්ඩයකි,
   1. පෑන 2. කොස්ස 3. පැන්සල් පෙට්ටිය 4. පොත

8. රංග අභ්‍යාසවල යෙදිය යුතු වන්නේ,
   1.නාට්‍ය අධ්‍යක්ෂවරයා ය. 2. නළුනිළියන් ය.
   3. සංගීත ශිල්පීන් ය. 4. ප්‍රේක්ෂකයන් ය.

9. ''පුහුල් හොරා කරෙන් දනේ'' මෙය,
   1. ජාතක කතාවකි. 2. ඓතිහාසික කතාවකි.
   3. නාට්‍යයකි. 4. ජන කතාවකි.

10. ''කැත්තක් අරගෙන වත්තට යනකොට''
    1. කවියක කොටසකි. 2. රබන් පදයක කොටසකි.
    3. ගීතයක කොටසකි. 4. නාට්‍ය දෙබසකි.

- **ගැලපෙන පරිදි යා කරන්න.**

| 'අ' කොටස | 'ආ' කොටස |
|---|---|
| 11. නාට්‍යයෙන් කියවෙන අදහස | පරිකල්පනය |
| 12. තවත් අයකු අනුව කටයුතු කිරීම හෙවත් ක්‍රියා කිරීම | ශ්වසන අභ්‍යාස |
| 13. රංගණයේදී යොදා ගන්නා උපකරණ | අනුකරණය |
| 14. සිතින් මවා ගැනීමේ හැකියාව | තේමාව |
| 15. හඬ පාලනයට ඉවහල් වේ. | නාට්‍යෝපකරණ |

- **හිස් තැනට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**
**(කුකුළු හාමි, ක්ෂණික නිරූපණ, දෙබස්, අතිමානුෂික, ආහාර්ය අභිනය, වලහා)**

16. නාට්‍යෝපකරණ අයත් වන්නේ, ........................................................ ට ය.
17. පෙර සූදානමකින් තොරව යමක් කිරීම ................................................. යි.
18. සත්ත්ව චරිතයකි, ............................................................
19. කටහඬ පුහුණුව සඳහා ............................................... කියවීම වැදගත් වේ.
20. ''පුංචි අපට දූන් තේරෙයි'' නාට්‍යයේ ප්‍රධාන චරිතය .................................................... ය.

(ල.2x20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. පහත සංවාද කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| කුකුල් හාමි | : | කවුදයි කවුදයි කරල ගෙනාවේ? |
| හතර දෙනාම | : | කුකුල් හාමි නොවැ කරල ගෙනාවෙ |
| කුකුල් හාමි | : | කව්දයි වී ටික කොටල ගෙනාවෙ. |
| හතර දෙනාම | : | (ඉතා උද්යෝගීමත්ව) කුකුල් හාමි නොවැ කොටල ගෙනාවෙ. |
| | | මෝලට ගොස් වී කොටල ගෙනාවෙ |

i. මෙම සංවාද (දෙබස්) කොටස අයත් වන නාට්‍යයේ නම කුමක් ද? (ල.3)
ii. එහි අධ්‍යක්ෂකවරයා කවු ද? (ල.3)
iii. මෙහි චරිත තුනක් නම් කරන්න. (ල.3)
iv. මෙම අවස්ථාවේදී මෙහි සිටින අය සෑදීමට සූදානම් වන්නේ කුමන ආහාරය ද? (ල.3)
v. මෙහි ඇතුළත් රංග විධානයක් ලියන්න. (ල.3)

02. i. ඔබ පාසලේදී ඉගෙන ගත් ජනකතා තුනක් නම් කරන්න. (ල.3)

ii. ජනකතාවක් ඉදිරිපත් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් ලියන්න. (ල.6)

iii. එහි එක් අවස්ථාවක් චිත්‍රයට නඟන්න. (කැමති ජනකතාවක) (ල.6)

03. i. නාට්‍ය යනු කුමක් ද? (ල.3)

ii. නාට්‍යයක දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල.6)

iii. ඔබ දන්නා නාට්‍ය තුනක නම් ලියා එය නිර්මාණකරුවන්ගේ ද නම් ලියන්න. (ල.6)

04. i. චරිත නිරූපණය සඳහා භාවිත කළ හැකි චරිත ප්‍රභේද (වර්ග) තුනක් නම් කරන්න. (ල.3)

ii. ඉන් ඔබ කැමති චරිත වර්ග දෙකකට අදාළව චරිත දෙක බැගින් නම් කරන්න (ල.4)

iii. ඔබ කැමති චරිත දෙකක් යොදා ගනිමින් කෙටි සංවාදයක් ලියා දක්වන්න. (ල.8)

05. i. පන්ති කාමරයකදී ක්ෂණික නිරූපණයක් සඳහා භාවිත කළ හැකි උපකරණ හතරක් නම් කරන්න. (ල.4)

ii. එම උපකරණ භාවිතයෙන් නිරූපණය කළ හැකි චරිත පහක් හෝ සිද්ධි පහක් නම් කරන්න. (ල.5)

iii. එක ම උපකරණයක් විවිධාකාරයෙන් ක්ෂණික නිරූපණය සඳහා යොදා ගත හැකි අවස්ථා තුනක් ලියන්න. (ල.6)

06. පහත සඳහන් මාතෘකාවන්ගෙන් එකක් තෝරා ගෙන කවි පන්තියක් නිර්මාණය කරන්න.

i. හිමිදිරි උදෑසන

ii. වැස්ස

iii. සඳ පෑයීම (ල. 15 x 4 = 60)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව (ප්‍රායෝගික පරීක්ෂණය)

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02යි.**

**සියලු ක්‍රියාකාරකම් (05) සඳහාම ඉදිරිපත් විය යුතුය**

01. කටහඬ පුහුණුව සඳහා භාවිත කරන නාට්‍ය පෙළක් හෝ නිර්දිෂ්ය ග්‍රන්ථ ඇසුරින් කෙටි සංවාදයක් කිරීමට යොමු කිරීම (ල.20)
02. මානුෂික හෝ අතිමානුෂික චරිතයක් නම් කොට නිරූපණය කරවීම (ල.20)
03. ගුරුවරයා විසින් සපයා ඇති ක්ෂණික නිරූපණය සඳහා භාවිතා කළ හැකි උපකරණ
    (අඩිකෝදුව පොත පැන්සල යනාදී ලෙස) (ල.30)
04. කණ්ඩායම් ලෙස දෙන ලද මාතෘකාවකට හෝ ඉඟියකට අනුව ක්ෂණික නිරූපණයක යෙදවීම (ල.30)

(මුළු ලකුණු 100)